# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/29 – 2024 මැයි මස 31 වැනි සිකුරාදා – 2024.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/261.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.13 දිනැති හා අංක 2323/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පානදුර, අළුබෝමුල්ල, ජනප්‍රිය මාවත, අංක 32/1 හි පදිංචි ඩී. එම්. ජී. නන්දන මයා (ගිණුම් නිලධාරී (විශ්‍රාමික)) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A32/2023 හා 2024.03.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041997 – 18 (2024/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

IR/COM/01/2020/261.
නඩු අංකය - A/32/2023.

ඩී. එම්. ජී. නන්දන මයා
ගිණුම් නිලධාරී (විශ්‍රාමික)
අංක 32/1, ජනප්‍රිය මාවත,
අළුබෝමුල්ල,
පානදුර.

*පළමු පාර්ශ්වය*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ ඩී. එම්. ජී. නන්දන මහතාට,

- 2002.03.01 දින සිට 2009.04.07 දින දක්වා වැඩ බැලීම සිදුකළ සහකාර ගණකාධිකාරී තනතුර හා වැටුප හිමි ද, හිමි නම් එය ලබා නොදීම හා
- 2013.12.06 දින සිට 2020.05.05 දින දක්වා රාජකාරි කටයුතු කළ MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ ගිණුම් නිලධාරී තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් දීමනාව හිමි ද, හිමි නම් එය ලබා නොදීම

මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**පෙනී සිටීම:-**

පළමු පාර්ශ්වය වෙනුවෙන්:- 1. ඉල්ලුම්කරු සහ නීතීඥ අනුෂ්ක රාජපක්ෂ
දෙවන පාර්ශ්වය වෙනුවෙන්:- 1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරි / මානව සම්පත් කළමනාකරණ සහ පාලන වසන්තා ජයවර්ධන මහත්මිය
2. කළමනාකරණ සහකාර ඩබ්. ඩී. කුසුමලතා මහත්මිය
3. නීතීඥ ඔෂිනි සේනාධිපති මෙනවිය
4. නීතීඥ දිලිණි ජයතිස්ස මෙනවිය

මෙම ආරාවුල ප්‍රථමවරට 2023.04.04 වන දින කැඳවූ අතර, එහිදී පළමු පාර්ශ්වය විසින් ප්‍රස්තුත කාරණා සම්බන්ධයෙන් පිටපත් තුනකින් යුතුව සිය පළමු ප්‍රකාශයේ පිටපත බේරුම්කරණයේදී ගොනුකරන ලදී. එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් ද තම පළමු ප්‍රකාශය පිටපත් තුනකින් යුක්තව එදිනම ගොනුකරන ලදී. දෙපාර්ශ්වයෙහිම පළමු ප්‍රකාශ එදිනම දෙපාර්ශ්වය විසින් හුවමාරු කරගත් අතර, ඒ අනුව, එම ප්‍රකාශයන් පරිශීලනයකොට දෙපාර්ශ්වය විසින්ම තම දෙවෙනි ලිඛිත ප්‍රකාශයන් ගොනු කරන බව බේරුම්කරණයට දන්වා සිටින ලදී. එම දෙවෙනි ප්‍රකාශ 2023.05.04 දින හෝ ඊට පෙර ගොනුකල යුතු බවට නියම කරන ලදී.

මෙම නඩුව 2023.05.15 දින නැවත කැඳවූ අතර, පළමු පාර්ශ්වය විසින් සිය දෙවන ලිඛිත ප්‍රකාශය නියමිත දිනට ගොනුකර තිබූ බව නිරීක්ෂණය කළ අතර, දෙවන පාර්ශ්වය විසින් සිය දෙවන ලිඛිත ප්‍රකාශය ඉදිරිපත් කිරීමට 2023.05.04 දින සිට සති දෙකක කාලයක් ලබාදෙන ලෙස ලිඛිත මෝසමක් මගින් ඉල්ලා තිබුණි. ඒ අනුව, 2023.05.18 දින හෝ ඊට පෙර සිය දෙවෙනි ප්‍රකාශය බේරුම්කරණ අධිකරණයට පිටපත් දෙකක් සහිතව ගොනුකරන ලෙස නියෝග කරන ලදී.

මෙම නඩුව නැවතත් 2023.06.12 වන දින කැඳවූ අතර, එහිදී දෙවන පාර්ශ්වය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරලමින්, ඉල්ලුම්කරු වයස අවුරුදු හැට (60) සම්පූර්ණවීම මත 2020.05.05 සේවයෙන් විශ්‍රාමයාමෙන් අනතුරුව මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවත් එබැවින් පළමු සහ දෙවන පාර්ශ්වයන් අතර, සේව්‍ය සේවක සම්බන්ධතාවයක් නොමැති බැවින් මෙය සජීවී ආරාවුලක් ලෙස සැලකීමට නොහැකි හෙයින් මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිශ්ප්‍රභා කරන ලෙස ගරු බේරුම්කරණයෙන් ඉල්ලා සිටින ලදී.

මෙම විරෝධතාවය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය සිය කරුණු පැහැදිලි කරමින් 2020.05.05 දින ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් ඇති බව පිළිගන්නා අතර, එම හේතුවෙන් සජීවී ආරාවුලක් නොමැති බවට ගෙන ආ තර්කය, ඉතා වැදගත් නඩු තීන්දුවක් වන එස්. බී. පෙරේරා එදිරිව Standard Charterd Bank and Others (1995) 1 SLR 73 නඩුවේදී ගරු අමරතුංග විනිශ්චයකාරතුමා සිය තීන්දුවේ ගෙන හැර පෑ කරුණු අනුව මෙම මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරන ලෙස ගරු බේරුම්කරණයෙන් ඉල්ලා සිටින ලදී. මෙහිදී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතාවය ගරු බේරුම්කරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී. එහිදී නැවතත් දෙවන පාර්ශවයේ නීතීඥතුමිය ඉල්ලා සිටියේ දෙවන පාර්ශ්වය වෙනුවෙන් සිය මූලික විරෝධතාවය ලිඛිත දේශනයක් මගින් ඉදිරිපත් කිරීමටය. ඊට අවසර දුන් ගරු බේරුම්කරණය 2023.07.10 ට පෙර එම ලිඛිත දේශනය ගොනු කරන ලෙස නියම කරන ලදී.

ඉන් අනතුරුව පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී. (2023.06.12 බේරුම්කරණ සටහන් හා සැබැඳේ.)

මෙම නඩුව 2023.07.11 දින නැවත කැඳවූ අතර එහිදී පළමු පාර්ශ්වය වන ඩී. එම්. ජී. නන්දන මහතා ප්‍රතිඥාදීමෙන් අනතුරුව ඔහුගේ නීතීඥ මහත්මිය විසින් සාක්ෂි මෙහෙයවන ලදී. (2023.07.11 බේරුම්කරණ සටහන් හා සැබැඳේ.)

මෙම නඩුව නැවතත් 2023.07.26 දින කැඳවූ අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහත්මිය කිසිදු පෙර දැනුම්දීමකින් තොරව විදෙස්ගතවී ඇති බවට ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින ලදී. තවදුරටත් පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීමට වෙනත් නීතිඥ මහතෙකු සොයාගත් බවත් නමුත්, ඔහුට එදින වෙනත් නඩු කටයුත්තක් සඳහා යෑමට සිදුව ඇති බැවින් මෙම නඩුව ඉදිරි දිනයකට කල් දමන ලෙස ඉල්ලා සිටින ලදී.

නැවතත් මෙම නඩුව 2023.09.07 දින කැඳවූ අතර, එහිදී පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ අනුෂ්ක රාජපක්ෂ මහතා පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් මෙතෙක් පෙනී සිටි නීතිඥ මහත්මිය තවදුරටත් මෙම නඩු කටයුත්ත සඳහා පෙනී නොසිටින බව වග උත්තරකාර ආයතනය දැනුම් දුන් අතර, වෙනත් නීති නියෝජනයක් ලබාගත යුතු බැවින් මෙම නඩුව වෙනත් දිනයකට කල් දමන ලෙස ඉල්ලා සිටින ලදී.

ඒ අනුව, මෙම ආරාවුල 2023.10.09 දින නැවත කැඳවූ අතර, දෙවන පාර්ශ්වය විසින් ප්‍රකාශකර සිටියේ,

> "උක්ත නඩුවෙහි 2013.12.06 දින සිට 2020.05.05 දින දක්වා ඉල්ලුම්කරු විසින් රාජකාරි කටයුතු සිදුකළ M.M.1-1 කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ ගිණුම් නිලධාරි තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් මෙම ඉල්ලුම්කරුට යම්කිසි දීමනාවක් හිමිවේද? නොවේද? පිළිබඳව සහ එලෙස හිමිවිය යුතු නම් ලැබිය යුතු මූල්‍යමය ගණනය කිරීම් පිළිබඳව දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවත්ය."

දෙවන පාර්ශ්වය විසින් එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ පිටපතක් එදින ගරු බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, ගරු බේරුම්කරණය විසින් දැනුම් දුන්නේ දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් පසු මෙම නඩුව නැවත කැඳවන බවය.

නැවත මෙම නඩුව 2023.12.04 දින කැඳවූ අවස්ථාවේදී දෙවන පාර්ශ්වය විසින් කියා සිටියේ පසුගිය නඩු දිනයේදී ඉදිරිපත් කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තවදුරටත් වෙනස්කර ඇති බවත් එසේ වෙනස්කරන ලද පත්‍රිකාව එදිනම ගරු බේරුම්කරණයට ඉදිරිපත් කරන බවත්ය. තවද එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2023.12.20 ට පෙර බේරුම්කරණ අංශයට ගොනුකරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරන ලදී. එහි පිටපතක් පළමු පාර්ශ්වයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමට ද නියම කරන ලදී.

නැවතත් මෙම නඩුව 2024.01.09 දින කැඳවූ අතර, දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය නියමිත දිනට බේරුම්කරණ අංශයට ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය කළ අතර, ආරාවුලේ පහත සඳහන් කරුණුවලට අදාළ විස්තර මීළඟ නඩු දිනයේදී ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරන ලදී.

1. 2002.03.01 - 2009.04.07 දක්වා ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින සහනය නොදීමට හේතු සාධක, පිළිගත හැකි ලේඛන සහිතව කරුණු ඉදිරිපත් කළ යුතු බව.

2. 2013.12.06 දින සිට 2020.05.05 දින දක්වා වැඩ බැලීමේ දීමනාව සම්බන්ධව අවස්ථා 4ක වැඩ බැලූ බව ඉල්ලුම්කරු කියා සිටින නමුත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අදාළ කාලය තුළ වැඩ බැලීමේ අවස්ථා දෙකකට පමණක් දීමනා ගෙවීමට තීරණය කර ඇති අතර, අනෙක් දෙවතාවේ වැඩ බැලීමේ දීමනාව නොගෙවීමට හේතුවූ කරුණු පිළිගත හැකි ලේඛන සමග ඉදිරිපත් කළ යුතු බව.

3. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, වැඩ බැලීමේ දීමනාව ගෙවීමට තීරණය කල කාලයට මූල්‍යමය ගණනයක් ඉදිරිපත් කළ යුතු බව.

2024.03.14 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ පසුගිය නඩු දිනයේදී ගරු බේරුම්කරණය විසින් ඉල්ලා සිටි කරුණු ද, සැලකිල්ලට ගෙන, ඉල්ලුම්කරුට පූර්ව හා අවසානාත්මක සමථ යෝජනා ලෙස එදින ගරු බේරුම්කරණයට ගොනු කළ R01 ලේඛනයේ ගණනය කිරීම්වලට අනුකූලව පළමු පාර්ශ්වයට වැඩ බලන රාජකාරි දීමනාවක් ලබාදීමට වගඋත්තරකාර පාර්ශ්වය එකඟ වී ඇති බවට දැනුම් දෙනු ලැබීය. එහිදී එම ලේඛනය පරීක්ෂා කර බැලූ ඉල්ලුම්කරු, දෙවන පාර්ශ්වය ලබාදීමට එකඟ වී ඇති පූර්ව හා අවසානාත්මක සමත යෝජනාව පිළිගැනීමට කැමැත්ත ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රදානයඃ-

මෙම ආරාවුලට අදාළව ඉදිරිපත් කළ සියලු සාක්ෂි, ලිඛිත ප්‍රකාශයන් සහ දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ පූර්ව සහ අවසානාත්මක සමථ යෝජනාව පළමු පාර්ශ්වය පිළිගැනීමට කැමැත්ත ප්‍රකාශකර ඇති හෙයින් ඉල්ලුම් කළ කාලයන්ට ඉල්ලුම්කරුට හිමි සම්පූර්ණ වැඩ බැලීමේ දීමනාව ලෙස රුපියල් හැට අටදහස් පන්සිය විසි දෙකයි ශත නමයක (රු. 68,522.09) මුදල මෙම ප්‍රදානය ගැසට් කළ දින සිට මසක් ඇතුළත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරියට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**රමාල් අයි. සිරිවර්ධන,**
බේරුම්කරු.

2024 මාර්තු මස 29 වන දින දී ය.

EOG 05 – 0199

---

මගේ අංකයඃ IR/COM/03/2022/59.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.27 දිනැති හා අංක 2325/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 13, සිරිල් සී. පෙරේරා මාවත, සිරිසඳ සෙවන නිවාස සංකීර්ණය, 1සී/එස්2/යූ6 හි පදිංචි එම්. එස්. එම්.

හුසේනි මහතා සහ කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/37/2023 හා 2024.03.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

**(1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත යටතේ බේරුම්කරණය)**

*බේරුම්කරණ නඩු අංකය:* A/37/2023.
ZR/COM/03/2022/59.

එම්. එස්. එම්. හුසේනි මහතා,
1C/F2/U6,
සිරිසඳ සෙවන නිවාස සංකීර්ණය,
සිරිල් සී. පෙරේරා මාවත,
කොළඹ 13.
සහ
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

1.0 **හැඳින්වීම**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන පනත සමග කියවෙන) පනත් මගින් සංශෝධිත (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.07 වැනි දින අංක 2313/68 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද නියෝගය මගින් ඉහත සඳහන් ආරාවුල බේරුම්කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කර ඇති බව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අංක IR/COM/03/2022/59 සහ 2023.03.20 දාතම දරන ලිපිය මගින් මා වෙත දන්වා එවා ඇත.

එම පැමිණිල්ල මගින් එම්. එස්. එම්. හුසේනි මහතා විසින් කම්කරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල වූයේ, දෙවන පාර්ශ්වය වන කොළඹ 1, චෛත්‍ය පාරේ අංක 19 හි පිහිටි වරාය අධිකාරිය විසින් පළමුවන පාර්ශ්වකරු වන එම්. එස්. එම්. හුසේනි මහතාට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව දින 5ක වැටුප අඩුකරමින් ලබා දී ඇති දඬුවම මගින් තමාට අසාධාරණයක් සිදුවී ඇති බවය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් බේරුම්කිරීම සඳහා මා වෙත දන්වා එවා ඇත්තේ ''ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරනු ලබන එම්. එස්. එම්. හුසේනි මහතාට විරුද්ධව කරන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව දඬුවමක් ලෙස දින 5ක වැටුප අඩුකරමින් ලබා දී ඇති දඬුවම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ, අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව තීරණය කිරීම'' වේ.

මෙම ආරාවුල බේරුම්කරණය මවිසින් 2023.04.24 දින ප.ව. 1.30ට ආරම්භ කරනු ලබන බව දන්වමින් කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයේ සහකාර කොමසාරිස් විසින් අංක A/37/2023 හා 2023.04.03 දාතම දරන ලිපිය මගින් දෙපාර්ශ්වයටම දන්වනු ලැබ තිබූ අතර, ඒ අනුව දෙපාර්ශ්වය ම නියමිත දින නියමිත වේලාවට පැමිණ සිටියහ.

බේරුම්කරණයේ දී, පළමුවන පාර්ශ්වය වන පැමිණිලිකාර හුසේනි මහතා වෙනුවෙන් තමා ම පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති නිලධාරිනී එම්. එම්. රිස්වාන් මහත්මිය සමග මානව සම්පත් කොට්ඨාසයේ කළමනාකාරිණී යූ. ආර්. ටී. උඩගෙදර මහත්මිය සහභාගි විය.

එදින දෙපාර්ශ්වය විසින් ම පැමිණිල්ලට අදාළව පළමු ප්‍රකාශ ඉදිරිපත් කරන ලද අතර ඒවා දෙපාර්ශ්වය විසින් බේරුම්කරු ඉදිරිපිටදී හුවමාරු කර ගන්නා ලදී.

1.1 **පසුබිම**

එම්. එස්. එම්. හුසේනි මහතා, 1998.12.23 දින සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කාර්ය සහායක තනතුරකට බඳවාගෙන ඇති අතර, 2005.08.17 දින සිට ගබඩා භාරකාර තනතුරකට උසස්වීම් ලැබ, පසුව ඉංජිනේරු යාන්ත්‍රික වැඩ කොට්ඨාසයට අනුයුක්ත කර සේවය කර ඇත.

ඒ අතරතුර, හුසේනි මහත විසින් ඔහු යටතේ සේවය කළ ඒ. ඩී. එම්. ෆාරුක් නමැති අයට පහරදීමක් සිදුකළ බවට චෝදනා කරමින්, හුසේනි මහතා වෙත චෝදනා පහකින් (5) සමන්විත චෝදනා පත්‍රයක භාරදී එම චෝදනා පත්‍රය විභාග කිරීම සඳහා අයි. නිරංජන් වික්‍රමනායක නමැති අයෙකු පරීක්ෂණ නිලධාරි ලෙස පත්කර ඇත. එම පරීක්ෂණ නිලධාරියා ඒ සම්බන්ධයෙන් 2019.07.11, 2019.07.22, 2019.08.09, 2019.10.03, 2019.10.11, 2020.07.14, 2020.07.28, 2020.09.15 යන දිනවල පරීක්ෂණ සැසිවාර අටක් පවත්වා එකී පරීක්ෂණ වාර්තාව 2022.03.09 දාතමින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අනුව චූදිත නිලධාරියාට එරෙහිව නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා පහටම වැරදිකරු බවට තීරණය කර ඇත.

ඒ අනුව, හුසේනි මහතා විසින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විනය නීති සංග්‍රහයේ ''ඉ'' උපලේඛනයේ (9) වගන්තිය යටතේ දැක්වෙන “කාර්ය නියුතුව සිටියදී කලහ කිරීම” යනුවෙන් සඳහන් බරපතල සණයේ විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති බැවින්, එකී විනය නීති සංග්‍රහයේ 25 (1) රීතියේ (අ) වගන්තිය පරිදි හුසේනි මහතාට දින පහක වැටුප් දඩයක් නියම කර ඇත.

එසේ දින පහක වැටුප් දඩයක් නියම කිරීම මගින් හුසේනි මහතාට අසාධාරණයක් සිදුවී ඇති බව සඳහන් කරමින් හුසේනි මහතා කම්කරු ඇමතිවරයාට තම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

1.2 **සිද්ධිගත කරුණු**

පළමුවන පාර්ශ්වය වන හුසේනි මහතා විසින් 2023.04.18 දාතමින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල (15-16 පිටු) මගින් සඳහන් කර ඇත්තේ, තමා විසින් 2019.02.14 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (කොළඹ) කාර්යාලය තුළ දී, තමා සහ තමා යටතේ සේවය කරමින් සිටි, ඒ. ඩී එම්. ෆාරුක් මහතා අතර ඇති වූ බහින් බස්වීමක් පිළිබඳව සිදුවීම, තමා පාරුක් මහතාට කළ පහරදීමක් බවට හුවා දක්වමින් බොරු පැමිණිල්ලක් ඉදිරිපත් කර, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා, ඇසින් දුටු සාක්ෂි පිළි නොගෙන තමන්ට දඬුවම් වශයෙන් දින පහක වැටුප් දඩයක් පනවා ඇති බවත්, සිදුවූවායයි කියනු ලබන පහරදීම සිදුවන අවස්ථාවේ, එය ඇසින් දුටුවායයි කියනු ලැබූ, සාක්ෂිකරුවන් ලෙස මූලික විමර්ශනයේ දී හඳුනාගන්නා ලද සාක්ෂිකරුවන් වූ ටී. ඒ. කේ. පී. තෙවරප්පෙරුම හා එස්. ඒ. ධර්මසේන යන දෙදෙනා ද, චූදිතයන් බවට පත්කර, ඔවුන්ට එරෙහිව ද බරපතල විෂමාචාරයක් කළ බව සඳහන් කරමින් චෝදනා ඉදිරිපත් කර අවවාද කර ඇති බවත්ය.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකරුවන් වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2023.05.18 දාතමින් සැළකිරීමක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, පළමු පාර්ශ්වය විසින් 2019.02.14 වන දින තමන්ගේ සේවා ස්ථානයේ දී සේවය කළ වැඩ සහායක ඒ. ඩී. එම්. ෆාරුක් යන අයට පහරදී තුවාල සිදුකිරීම සම්බන්ධනේ ෆාරුක් මහතා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයකට යොමු කරන ලදුව, වෛද්‍ය මධ්‍යස්ථානයේ ගිලන් රථයකින් ෆාරුක් මහතා රෝහලට ගෙන යන ලද බවත්, ප්‍රස්තුත සිද්ධිය දුටු බවට පළමු පාර්ශ්වය විසින් සඳහන් කර ඇති තෙවරප්පෙරුම හා එස්. ඒ. ධර්මසේන යන අය, හුසේනි මහතා විසින් ෆාරුක් මහතා

සමග බහින්බස් වීමක් සිදුවූ බව දුටු බව ප්‍රකාශ කර ඇති බවත්, පහරදීම සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තාවක් නිකුත් කර ඇති බවත්, ප්‍රශ්නගත සිද්ධියට සම්බන්ධයෙන් පරිපාලක ඊ. ඒ. ඩබ්. එදිරිසිංහ මහතා එදිනම ලොග් සටහනක් තබා තිබූ බවත්, ඒ මගින් පළමු පාර්ශ්වය විසින් ෆාරුක් මහතාට පහරදුන් බව තහවුරු වන බවත්, ආරක්ෂක නිලධාරීන් තම බලය ඉක්මවා ක්‍රියා කර නැති බවත්, මෙම රාජකාරි ඉහළින්ම ඉටුකර ඇති බවත්, ඒ අනුව වරාය අධිකාරියේ විනය රීති මාලාව අනුව පළමුවන පාර්ශ්වයට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා සියලුම සාක්ෂි සැලකිල්ලට ගෙන චෝදනා ඔප්පුවීම මත දින පහක වැටුප් දඩයක් නියමකර ඇති බවත්, එහෙයින්, පළමුවන පාර්ශ්වයට සහනයක් ලබා නොදී විමර්ශනය අවසන් කරන ලෙසත්ය.

තවද, දෙවන පාර්ශ්වය විසින් 2023.06.19 දාතම දරන සැලකිරීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ, පළමුවන පාර්ශ්වකරු විසින් මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කොළඹ 01 කම්කරු උසාවියේ පැවති මේ හා සමාන ඉල්ලීමක් පිළිබඳ අංක 01/89/2021 දරන නඩුවේ දී මූලික විරෝධතා හමුවේ තම නඩුව ඉල්ලා අස්කර ගැනීම නිසා නඩුව නිශ්ප්‍රභා කළ බවත්, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශයේ පැවති අංක CS/COA/G/05/279/21 දරන සමථකරණයේදී පාර්ශ්වකරුවන් අතර සමථයක් ඇති නොවීමේ හේතුව මත මෙම ආරාවුල බේරුම්කරණය සඳහා යොමුකර ඇති බැවින්, සමථකරණයේ දී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද 2021.12.29 (R.1) හා 2013.03.28 (R.2) දාතම දරන සැලකිරීම් මෙම බේරුම්කරණයේ දී සැලකිල්ලට ගන්නා ලෙසත් ය.

ඒ අනුව එකී සැලකිරීම් සැලකිල්ලට ගන්නා ලද අතර 2021.12.29 දාතම දරන සැලකිරීම්වල සඳහන් වන්නේ, පැමිණිලිකාර හුසේනි මහතා විසින් ඒ. ඩී. එම් ෆාරුක් මහතාට පහර දී තුවාල සිදු කිරීමේ බරපතල විෂමාචාරය සම්බන්ධයෙන් පැවති විධිමත් විනය පරීක්ෂණයේ දී, 2019.05.02 දිනැති චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලට වැරදිකරුවීම මත දඬුවමක් ලෙස 2021.03.15 දින, දින පහක වැටුප් දඩයක් නියම කර ඇති බවත්, එම දඬුවම ඉවත් කරන ලෙස හුසේනි මහතා වරාය අධිකාරියේ සභාපතිවරයාට ඉදිරිපත් කරන ලද අභියාචනය 2021.06.07 දින ප්‍රතික්ෂේප කර ඇති බවත්ය.

ඊට අමතරව, හුසේනි මහතාගේ පූර්ව චර්යාවන් අනුව, 2006.05.11 දින ලිපිකරු මහතෙකුට අසභ්‍ය වචනයෙන් බැන වැදීම සම්බන්ධයෙන් වැරදිකරු වූ හෙයින්, අවවාද කිරීමක් සිදුකරනු ලද බවද, උසස් නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද නියෝග යක් ප්‍රතික්ෂේප කිරීමේ විෂමාචාරයක් කිරීම සම්බන්ධයෙන් 2007.10.29 දිනැති චෝදනා පත්‍රයකට වැරදිකරුවීම හේතු කොටගෙන එක් දිනක වැටුප් දඩයක් පමුණුවා ඇති බවද, 2008.03.25 දින රාජකාරි වේලාව තුළ කලහ කර ගැනීම සහ විනය විරෝධී ලෙස හැසිරීම සම්බන්ධයෙන් පවත්නා ලද විධිමත් විනය පරීක්ෂණයේ දී වැරදිකරු වීම හේතු කොටගෙන එක් දිනක වැටුප් දඩයක් පමුණුවා ඇති බවද, දෙවන පාර්ශ්වය විසින් එකී සැලකිරීම්වල සඳහන් කර ඇත.

ඉහත සඳහන් කළ 2022.03.28 දාතම දරන සැලකිරීම්වල (R.2) සඳහන් වන්නේ, බේරුම්කරණයට තුඩු දී ඇති කරුණ මත කාර්ය නියුක්තව සිටියදී කළහ කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පවතින විනය රීතින්ට අනුව බරපතල විෂමාචාරයක් බවත්. ඒ සඳහා දින හතක හෝ දින පහක වැටුප් දඩයක් ලබාදිය හැකි බවත්. චූදිත නිලධාරියාට ලබා දී ඇත්තේ දින පහක් වූ අවම වැටුප් දඩයක් බවත්. එහෙයින් ඔහුට අසාධාරණයක් සිදුවී නොමැති බවත්. පැමිණිලිකාර හුසේනි මහතා ඒ වනවිට එනම් 2022.10.27 දින සිට පරිපාලක තනතුරකට උසස් කර ඇති බවත්, එසේ උසස් කිරීම කර ඇත්තේ 2019.10.27 දින සිට 2022.10.26 දින දක්වා කාලය තුල ඔහුගේ පැමිණීම. හැසිරීම හා වැඩ පිළිබඳ ඇගයීමකින් පසුවන බවත්ය.

තවද දෙවන පාර්ශ්වය විසින් පැමිණිලිකරුට විරුද්ධව පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේ දී ඔහු වෙනුවෙන් මිත්‍රයෙකුට පෙනී සිටීමට අවස්ථාව ලබාදී ඇති බවත්. පැමිණිලි පාර්ශ්වයට හරස් ප්‍රශ්න විමසීමට හා සාක්ෂි ලේඛන ගොනු කිරීමට අවස්ථාවක් ලබාදී ඇති බවත්. පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණ සම්බන්ධයෙන් සෑහීමකට පත්වන බවට සඳහන් කරමින්. පරීක්ෂණ සටහන්වලට අත්සන් තබා ඇති බවත්. එකී විධිමත් විනය පරීක්ෂණයේ විනය පරීක්ෂණ වාර්ථාව (R.3) ලෙසද විධිමත් විනය පරීක්ෂණයේ කාර්ය සටහන් (R.4) ලෙස ද. විනය රීති සංග්‍රහයේ පිටපතක් (R.5) ලෙස ද ඉදිරිපත් කරන බවත්. ඒ අනුව චූදිත නිලධාරියාට වෙනස් කොට සැලකීමත් සිදුකර නොමැති බවත්. එහෙයින් පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙසත්ය.

ඒ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වය ප්‍රති උත්තර වශයෙන් ඉදිරිපත් කර ඇති සැලකිරීම් මගින් සඳහන් කර ඇත්තේ තමාට එරෙහිව පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයේදී බොරු සාක්ෂි මත තමා වරදකරුවකු කළ නිසා තමාට දින පහක වැටුප් දඩයක් ගැසූ බවත්. ඒ නිසා තමාට ලැබීමට තිබූ උසස්වීම වසර තුනකින් කල්ගිය බවත්ය.

ඉහත සඳහන් කර ඇති පරිදි විධිමත් විනය පරීක්ෂණක්. විනය නීති මාලාවන්හි සඳහන් විධිවිධාන අනුව පවත්වා ඇති බවට දෙවන පාර්ශ්වය කර ඇති ප්‍රකාශය බේරුම්කරු විසින් පිළිගන්නා නමුත්. පළමුවන පාර්ශ්වය විසින් ඒ පිළිබඳව සෑහීමට පත් නොවන බවට කර ඇති ප්‍රකාශය පහසුවෙන් ඉවත දැමිය හැකි කරුණක් නොවන බවද බේරුම්කරුගේ අදහස වේ. මන්ද යත් විනය නීති මාලාවන්හි සඳහන් විධිවිධාන අනුව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම ප්‍රමාණවත් නොවන අතර එකී විධිමත් විනය පරීක්ෂණය විනය නීති මාලාවන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව ස්වාධීනව හා අපක්ෂපාතීව පැවැත්වීමද. විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වූ වාචික හා ලිඛිත සාක්ෂි සියල්ල ඇගයීමට ලක්කර තීරණයක් දීමද, අවශ්‍යවන නිසාය.

**2.0. දෙවන පාර්ශ්වකරු විසින් විධිමත් විනය, විනය නීති මාලාවන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව ස්වාධිනව හා අපක්ෂපාතිව පරික්ෂණයක් පැවැත්වූයේද?**

ඉහත සඳහන් කළ පරිදි. ආරාවුලට පදනම් වී ඇත්තේ දෙවන පාර්ශ්වය විසින් ගන්නා ලද විනය තීරණය වන හෙයින්. එකී විනය තීරණය ගැනීමට උපස්ථම්භක වූ විධිමත් විනය පරීක්ෂණය, විනය රීති මාලාව අනුව සිදුවී ඇද්ද යන්න හා පරීක්ෂණ නිලධාරියා යුක්ති සහගත හා සාධාරණ තීරණයක් ගෙන ඇත්ද යන්න ද, එකී විධිමත් විනය පරීක්ෂණයට පදනම් වූ මූලික විමර්ශනය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාත්මක වූ විනය කාර්ය පටිපාටිය අනුවම සිදුකර ඇත්ද යන්නද, පිළිබඳව අවධානය යොමු කිරීම උචිත බව බේරුම්කරුගේ අදහස වේ. බේරුම්කරු විසින් පළමුවන පරීක්ෂණ සැසිවාරයේදීම විධිමත් විනය පරීක්ෂණයට අදාළ කාර්ය සටහන් වාර්තාවල පිටපතක් හා විතය පරීක්ෂණ වාර්තාවේ පිටපතක් සමග විනය රීති මාලාව ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශ්වයට දන්වන ලද්දේ එබැවිනි, ඒ අනුව දෙවන පාර්ශ්වය (R.3) වශයෙන් පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවද, (R.4) වශයෙන් කාර්ය සටහන් වාර්තාවද. ((R.5) වශයෙන් විනය නීති මාලාව ද. ඉදිරිපත් කර ඇත.

එහෙයින් පළමුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාත්මක වූ විනය කාර්ය පටිපාටියක් ස්ථාපනය වී තිබුනේද යන්නත්, දෙවනුව එකී විනය කාර්ය පරිපාටිය අනුව මූලික විමර්ශනය සිදු කර ඇත්ද. යන්නත් තෙවනුව එකී විනය කාර්ය පටිපාටිය අනුව විධිමත් විනය පරීක්ෂණය පැවැත් වූයේද, යන්නත් විමසීමට භාජනය කිරීමට තීරණය කරමි. මන්ද යත් නීතිමය වරද නිසා මෙන්ම පටිපාටිමය වරද නිසාද, පාර්ශ්වකරුවන්ට අගතියක් විය හැකි බැවිණි.

**2.1. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාත්මක වූ විනය කාර්ය පටිපාටියක් තිබූ බව**

දෙවන පාර්ශ්වය විසින් (R.5) වශයෙන් සළකුනු කර ඉදිරිපත් කර ඇති විනය රීති මාලාව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාත්මක වූ විනය ක්‍රියාපටිපාටිය බව අනාවරණය විය. ආයතනයක සේවකයෙකු කිසියම් විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇත්ද යන්න පිළිබඳව සැකයක් හෝ තොරතුරක් ලැබුණු තැන සිට එම සැකය හෝ තොරතුරු සත්‍ය හෝ අසත්‍ය බව සනාථ කර ගන්නා තැන දක්වාත්. විෂමාචාර ක්‍රියාවක් සිදු වී ඇත්නම්, ඒ සඳහා විනය බලධරයා විසින් ගනු ලබන ක්‍රියාමාර්ගය හෝ දඬුවම පිළිබඳවත්. එම දඬුවම සම්බන්ධයෙන් චෝදනාලත් පුද්ගලයාට ඒ පිළිබඳව අභියාචනා කිරීම දක්වා වූ කාර්ය පටිපාටිය ඇතුළත් විය යුතු වේ.

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට හඳුන්වා දී ඇති ආකාරයේ විධිමත් විනය පරීක්ෂණ මෙහෙයවීම සම්බන්ධයෙන් පිළිගත් කාර්ය පටිපාටියක් සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හඳුන්වා දී නැති හෙයින්. ආයතන චක්‍රලේඛ අංක 364 හා 1981.04.06 දාතම දරන චක්‍රලේඛය මගින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට රාජ්‍ය සංස්ථා සභාපතිවරයාගේ හා රජයට පවරගත් ව්‍යාපාරයන්හි ප්‍රධානීන්ට දන්වා එවා ඇත්තේ 1980.02.13 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩය ආදර්ශ වශයෙන් උපයෝගි කර ගනිමින් සංස්ථා සේවකයින් සඳහා මෙවැනිම ව්‍යවස්ථා සංග්‍රහයක් සකස් කිරීම පිණිස තමන් යටතේ ඇති රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්ට අමාත්‍යවරුන් විසින් උපදෙස් දිය යුතු බවය.

වරාය අධිකාරිය, තම ආයතනයේ සේවකයින් සඳහා සකස් කර ඇති විනය රීති මාලාව, (R.5) විනය රීති මාලාව ඉහත සඳහන් කැබිනට් තීරණය අනුව සකස් කරන ලද එකක්ද යන්න සඳහන් නොවන අතර. එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ දිනයක් හෝ ක්‍රියාත්මක වන දිනයක් හෝ සඳහන් කර නැත. එසේම එම විනය රීති මාලාව (R.5) සත්‍ය පිටපතක් බවට කිසිවකු විසින් සහතික කර නැත.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාත්මක වූ විනය ක්‍රියාපටිපාටිය රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට හඳුන්වා දී ඇති ආකාරයේ විනය ක්‍රියාපටිපාටියක් නොවුණත් එහි ඉහත සඳහන් මූලිකාංග සියල්ල ඇතුළත් වී ඇති බව බැලුබැල්මට පෙනීයයි.

**2.2. මූලික විමර්ශනයක් පැවැත්වූ බව.**

ප්‍රස්තුත සිද්ධියට අදාළව පළමුවන පාර්ශ්වයට එරෙහි චෝදනා පත්‍රයක් නිකුත් කිරීමේදී මූලික විමර්ශනයක් සිදුකරන ලද බැව් පළමුවන පාර්ශ්වය මෙන්ම දෙවන පාර්ශ්වයද සඳහන් කර ඇතත්. එම වාර්තාවේ පිටපතක් බේරුම්කරු වෙත ඉදිරිපත් වුයේ නැත. එහෙයින් එම මූලික විමර්ශනය කිනම් ආකාරයකින් පවත්වා තිබුණේද යන්න සම්බන්ධයෙන් බේරුම්කරුට කිසියම් අදහසක් ප්‍රකශ කළ නොහැකිය. කෙසේ වුවත් ඒ සම්බන්ධයෙන් විනය පරීක්ෂණ නිලධාරියා තම පරීක්ෂණ වාර්තාවේ (R3) ඒ පිළිබඳව විශේෂ සටහන් ලෙස දක්වා ඇති කරුණු මගින් ඒ පිළිබඳ අදහසක් ගත හැකි හෙයින් එය පහත සඳහන් කරනු ලැබේ.

> "2019.02.14 දින 07.45 පැයට පමණ හෝ ඊට ආසන්න වේලාවකදී, යාන්ත්‍රික වැඩ කොට්ඨාසයේ වාස්තු වැඩ අංශයේ විවේකාගාරය තුළ දී ඒ. බී. එච්. ෆාරුක් (කාර්යාල කාර්ය සහායක) හා එම්. එස්. එම්. හුසේනි (ගබඩා භාරකරු) යන අය බහින් බස්වීමක්, සිදුවීම යන කරුණු මුල්කොටගෙන සිදුකරන ලද මූලික විමර්ශනය හා පසුව සිදු කරනු ලද කාර්යයන් තුළදී ඒ. බී. එච්. ෆාරුක් යන අය මෙම සිදුවීමට එනම්, විනය විරෝධී ලෙස කටයුතු සිදු නොකරන ලද බවට පූර්ව නිගමනයක් පදනම් කර ගනිමින් මෙහි මූලික කාර්ය සිදුවී ඇත. නොඑසේ නම්, බහින් බස්වීමක් තුළදී ඊට අදාළ වන්නා වූ සියලු පාර්ශ්වයන් සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ලබාදීම සිදුකළ යුතුවේ. එලෙස නොවන අවස්ථා වලදී චෝදනා පත්‍ර ලබා නොදීමට තරම් කරුණු (වී නම් ඒවා) පැහැදිලිව විනය ගොනුව තුළ අන්තර්ගත විය යුතුය. එබැවින් චූදිත එම්. එස්, එම්. හුසේනි යන අයට දඬුවම් පැමිණවීමේදී එම කරුණු සැලකිල්ලට ගැනීම වඩා සුදුසු බව කාරුණිකව පෙන්වා දෙමි."

එයින් පෙනී යන්නේ ප්‍රශ්නගත සිද්ධියට අදාළව මූලික විමර්ශනයක් සිදුකර ඇති බවත් එම මූලික විමර්ශනය අපක්ෂපාති ලෙස සිදුකර නොමැති බවත්ය.

**2.3. විධිමත් විනය පරීක්ෂණය විනය රීති මාලාව අනුව යුක්ති සහගත සාධාරණ ලෙස පැවැත්වීද යන්න.**

විනය රීති මාලාවේ විනයානුකූලව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් බොහෝ කරුණු සඳහන් වී ඇතත්, විනය පරීක්ෂණයක් පැවැත්වීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු ප්‍රමාණවත් ලෙස සඳහන් කර නොමැති අතරම නිශ්චිතව හා පැහැදිලිව සඳහන් කර නැත. ඒ කෙසේ වෙතත්, රජයේ අමාත්‍යාංශවල විනය පරීක්ෂණ පැවැත්වීමේ දී අනුගමනය කරන කාර්ය පටිපාටිය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහාද භාවිතා කළ යුතුය යනුවෙන් නියමයක් නැති හෙයින් අධිකාරියේ පැවැති එකී විනය ක්‍රියා පටිපාටියේ විධිවිධාන සමග ස්වාභාවික යුක්තියේ මූලධර්ම මත පරීක්ෂණය පවත්වා ඇත්ද යන්න විමසා බැලිය හැකිය.

එහෙයින් එකී විධිමත් විනය පරීක්ෂණය විනය රීති මාලාව අනුව යුක්ති සහගත සාධාරණ ලෙස පැවැත්වීද යන්න පිළිබඳව විමසීමට ලක්කිරීම උචිතයැයි සිතමි.

සිද්ධිය වන අවස්ථාවේ එහි සිටි ටී. ඒ. කේ. සී. තෙවරප්පෙරුම මහතා සහ එස්. ඒ. ධර්මසේන මහතා සිද්ධිය වන අවස්ථාවේ එහි සිටින බවට සාක්ෂි දෙන ලද නමුත්, ඔවුන් දෙදෙනාගෙන් කිසිවෙක් හුසේන් මහතා ෆාරුක් මහතාට පහරදුන් බවක් සඳහන් කර නැති අතර, තෙවරප්පෙරුම මහතා ප්‍රකාශ කර ඇත්තේ, පසුව ෆාරුක් මහතා ඒ වේලාවේ කලබලයෙන් වගේ එළියට ගිය බවත්, ඒ අවස්ථාවේදී ඔහු විවේකාගාරයේ දොර අරින විට එහි තිබුණු ලොකර් එකක ඔහු හැපුන බවත්ය.

තෙවරප්පෙරුම මහතාගේ මෙම සාක්ෂිය වැදගත් එකක් වුවත්, ඒ පිළිබඳ පරීක්ෂණ නිලධාරියා අවධානය යොමුකර නැත, එසේම ඉදිරිපත් වූ වෛද්‍ය වාර්තාවත්, විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි ලේඛන වශයෙන් ඉදිරිපත් වූ බවත් සඳහන් නොවේ. එහෙත් ඒ පිළිබඳ අවධානය යොමුකර ඇති බව ප්‍රකාශ කර ඇති නමුත්, සාක්ෂි විමසීමක් සිදුකර ඇති බවක් හෝ පෙනි යන්නේ නැත.

ප්‍රස්තුත සිද්ධිය සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකරු විසින් බේරුම්කරු වෙත ඉදිරිපත් කර ඇති සැලකිරීම් දෙකේදිම නැවත නැවත පුන පුනා ප්‍රකාශ කර ඇත්තේ එම පර්යක්ෂණයේදී සාක්ෂිකරුවන් මූලික විමර්ශනයේදී ලබාදුන් සාක්ෂිම ලබාදෙමින්

පහරදීමක් සිදු නොවූ බවත්, පහරදීමක් පිළිබඳ ශබ්දයක් නොඇසුණු බවත්, බහින් බස්වීමක් පමණක් සිදු වූ බවත් ප්‍රකාශ කර සිටියදී සහ විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබාදුන් පුද්ගලයන් හයදෙනාගෙන් පුද්ගලයන් හතර දෙනෙක්ම පහරදීමක් සිදුකළ බවට සාක්ෂි ලබා නොතිබියදී විධිමත් විනය පරීක්ෂණ නිලධාරියා විසින් ආරක්ෂක නිලධාරී මහතාගේ ප්‍රකාශ හා වාර්තා පමණක් සැලකිලට ගෙන අවසන් තීන්දුවට පැමිණ හුසේන් මහතාට දඬුවම් නිර්දේශ කර ඇති බවය.

**2.4. පරීක්ෂණ නිලධාරියාගේ පරීක්ෂණ වාර්තාව**

විධිමත් විනය පරීක්ෂණය අවසානයේ පරීක්ෂණ නිලධාරියා විසින් සකස් කරන ලද විනය පරීක්ෂණ වාර්තාව දෙවන පාර්ශ්වකරු විසින් (R3) වශයෙන් සළකුණු කරමින් ලිඛිත සැළකිරීම් සමග ඉදිරිපත් පත් කර තිබණ.

විනය පරීක්ෂණ වාර්තාවක ඇතුළත් විය යුතු අනෙකුත් කරුණු අතර, පරීක්ෂණ නිලධාරියා විභාගයට ගත් චෝදනා පත්‍රය කිනම් චෝදනා පත්‍රයක්ද, ඉදිරිපත් වී ඇති චෝදනා මොනවාද යන්නද, විනිශ්චය සභාව ඉදිරියේ සාක්ෂි ලබාදුන් සාක්ෂිකරුවන්ගේ නාමලේඛනය ද, සැළකිල්ලට ගත් ලිඛිත සාක්ෂිද, ඇතුළත් විය යුතුය. එකී කරුණු සඳහන් නොකොට, ඉදිරිපත් වී ඇති සාක්ෂි චෝදනාවලට අනුව සම්පිණ්ඩනය කිරීමට හෝ සාක්ෂි විශ්ලේෂණය කිරීමට හැකියාවක් නැත. එපමණක් නොව පරීක්ෂණ නිලධාරියා විසින් විභාගයට ගන්නා ලද චෝදනා පත්‍රය කුමක්ද යන්න සඳහන් නොකොට, විනය පරීක්ෂණ වාර්තාවේ සඳහන් නිගමනවල චෝදනා පත්‍රයේ චෝදනා අංක 1, 2, 3, 4, 5 යන චෝදනාවලට චූදිත නිලධාරියා වැරදිකරු වන බව සඳහන් කිරීම ගැටලු සහගතය.

ඒ හැරත්, විධිමත් විමර්ශනයේ කාර්ය සටහන් වාර්තා (R 4) මෙන්ම පක්ෂ වාර්තාව (R 3) පරීක්ෂා කර බැවීමේදී පෙනී යන්නේ පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණය හුසේන් මහතාට පමණක් එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයක් නොව, හුසේනි මහතා, ෆාරුක් මහතාට පහර දුන්නා යැයි කියනු ලබන අවස්ථාවේ ඒ අසල සිටි කාර්යාල කාර්ය සහායකවරුන් දෙදෙනා වන ටී. ඒ. කේ. සී. තෙවරප්පෙරුම මහතාට සහ එස්. ඒ. ධර්මසේන මහතාටද විරුද්ධව එකම විනිශ්චය සභාවේ එකට පැවත්වූ විධිමත් විනය පරීක්ෂණයක් වන බවය.

විධිමත් විනය පක්ෂණය සඳහා භාජනය කරන ලද චෝදනා පත්‍රයේ පිටපතක් බේරුම්කරණයේදී ඉදිරිපත් නොවූ හෙයින්, විධිමත් විනය පරීක්ෂණයේදී එකී සේවකයින් තිදෙනාට එකම චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණේද නැතහොත් වෙන වෙනම චෝදනා පත්‍ර නිකුත් කර තිබුණේද යන්න පැහැදිලි නැත.

එමෙන්ම විධිමත් විනය පරීක්ෂණය සඳහා කැඳවීමට නියමිත වූ සාක්ෂිකරුවන් කිදෙනෙක් සිටියාද යන්න හෝ චෝදනා පත්‍රයේ සඳහන් ලිපි ලේඛන මොනවාද යන්න පිළිබඳව කාර්ය සටහන් වාර්තාවල හෝ විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ හෝ සඳහන් කර නැත. කෙසේ වෙතත් විනය පරීක්ෂණ වාර්තාවේ දෙවන ඡේදයේ සඳහන් වන්නේ පුද්ගලයන් තිදෙනෙකු සාක්ෂිදීම සඳහා කැඳවීමට තීරණය කර ඇති බවය. එහෙත් ඒ කවුද යන්න එහි සඳහන් වී නැත. එතෙකුදු වුවත් කාර්ය සටහන් වාර්තාවල සාක්ෂිකරුවන් හයදෙනෙකු පිළිබඳව සඳහන් වන අතර, ඒ අය අතර පහරකෑමට ලක් වූවායැයි කියනු ලබන බවට සඳහන් වන වැඩ සහායක ඒ. බී. එම්. ෆාරුක් මහතා ද, පහර දුන් බවට චෝදනා ලත් හුසේනි මහතා ද වන අතර ඊට අමතරව සඳහන් වන වැඩ කළමනාකරු බී. ඩී. එස්. චන්දන මහතා ද සහකාර ආරක්ෂක නිලධාරි බී. ඩී. ජේ. වී. වික්‍රමසිංහ මහතා ද සිද්ධිය වන අවස්ථාවේ එහි සිටි ටී. ඒ. කේ. සී. තෙවරප්පෙරුම සහ එස්. ඒ. ධර්මසේන මහත්වරු ද සිටි බව ද සඳහන් වේ.

තවද, පරීක්ෂණ නිලධාරියා 2019.07.11 දින සිට පරීක්ෂණ කටයුතු කරගෙන යන ලද නමුදු, පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරනු ලබන 2021.03.09 දින වන විටත්, ඔහු පරීක්ෂණ නිලධාරි වශයෙන් නිසි බලධාරියා විසින් අනුමත කර නැති බව පරීක්ෂණ වාර්තාවේ පරීක්ෂණ නිලධාරියා විසින් ආරම්භයේදීම තබා ඇති සටහන් මගින් පෙනී යයි. එනම් ඔහු සඳහන් කර ඇත්තේ "උක්ත විෂමාචාරය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණය ප්‍රධාන මානව සම්පත් කළමනාකරුගේ අනුමැතියට යටත්ව තමා වෙත පැවරුණු අතර, අදාළ විධිමත් විනය පරීක්ෂණය 2019.07.11 දින කැඳවන ලද බවය". ඒ අනුව පරීක්ෂණ නිලධාරියාට විනය පරීක්ෂණය පැවැත්වීමට විධිමත් අනුමැතියක් ලැබී නොතිබූ බව ද ගම්‍ය වේ.

මෙම විධිමත් විනය පරීක්ෂණය පවත්වා ඇත්තේ චූදිත නිලධාරීන් තිදෙනෙකුට එරෙහිව එකම විනිශ්චය සභාවක් ඉදිරියේදී එකට බව පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාව කියවීමේදී අනාවරණය වේ. එහෙත් ඒ බවක් පරීක්ෂණ නිලධාරියා අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු වුවත්, එය සඳහන් කර නොමැත. එපමණක් නොව, එක් එක් චූදිතයාට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා පත්‍ර මොනවාද යන්න පිළිබඳවද සඳහන් කර නැත.

ඒ අනුව පළමුවන පාර්ශ්වකරු තම ලිඛිත සැළකිරීම්වල සඳහන් කර ඇති පරිදි විනය පරීක්ෂණ නිලධාරියා විසින් විධිමත් විනය පරීක්ෂණයට ඉදිරිපත් වූ සාක්ෂි පිළිබඳ නිසි විශ්ලේෂණයක් කර නැති බව වාර්තාවේ සඳහන් කරුණු වලින් අනාවරණය වේ.

තවද විනය පරීක්ෂණ වාර්තාවේ සඳහන් වන පරිදි, විනිශ්චය සභාව ඉදිරියේ සාක්ෂි ලබාදුන් සහකාර ආරක්ෂක නිලධාරි ඩබ්. එස්. වික්‍රමසිංහ මහතා සිද්ධිය වන අවස්ථාවේ නොසිටි බව පැහැදිලි වන අතර, වාත්තු වැඩ අංශයේ වැඩ කළමනාකරු වූ ඩී. වී. චන්දන මහතා ද සිද්ධිය වූ අවස්ථාවේ එහි සිටි බවක් සනාථ වන්නේ නැත. එමෙන්ම විනිශ්චය සභාව ඉදිරියේ සාක්ෂි ලබාදී ඇති වැඩබලන පරිපාලක ඊ. ඒ. ඩබ්. එදිරිසිංහ මහතා ද සිද්ධිය වූ අවස්ථාවේ එහි සිටි සාක්ෂිකරුවෙකු නොවේ.

පළමුවන පාර්ශවකරු විසින්, තමාට සාධාරණයක් ඉටු නොවූ බවට කරනු ලබන පැමිණිල්ලේ සඳහන් වන එක් වැදගත් කරුණක් වන්නේ, ප්‍රශ්නගත සිද්ධිය වූ අවස්ථාවේ ඒ ලඟ සිටි එනම්, සිද්ධිය හොඳින් දුටු සාක්ෂිකරුවන් දෙදෙනාගේ සාක්ෂි සැලකිල්ලට නොගෙන වෙනත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත සැළකිල්ල යොමු කරමින් පරීක්ෂණ නිලධාරියා විසින් තමා වරදකරු කර ඇති බවය. එනම් පරීක්ෂණ නිලධාරියා විධිමත් පරීක්ෂණයේ දී සාක්ෂි විමසීමේදී නිසි අවධානයකින් සාක්ෂි විමසා නැති බවය.

ඉහත සඳහන් කර ඇති පරීක්ෂණ නිලධාරියාගේ නිරීක්ෂණ හා නිගමන හා විශේෂ සටහන් එක්ව ගත්කළ විධිමත් විනය පරීක්ෂණය "විධිමත්ව" පැවැත්වූයේ ද යන්න ගැටලු සහගත බව පෙනී යයි.

2.5 **විනය පරීක්ෂණ වාර්තාවේ නිගමන යුක්ති සහගත සාධාරණ එකක් ද යන වග**

පරීක්ෂණ නිලධාරියා තම පරීක්ෂණ වාර්තාවේ සඳහන් නිගමන වලින් පළමුව නිගමනයේදී පරීක්ෂණ නිලධාරියා සඳහන් කර ඇත්තේ, 2019.02.14 දින 7.45 පැයට හෝ ආසන්න වේලාවකදී ඒ. බී. එම්. ෆාරුක් හා එම්. එස්. එම්. හුසේනි යන අය බහින් බස්වීමක් සිදුවී ඇති බව පමණි. පහරදීමක් සිදුවී ඇති බවට නිගමනයක් කර නැත.

එහෙත් නිගමන අංක 3 හා අංක 5 හි දක්වා ඇත්තේ, චූදිත නිලධාරියා චෝදනා අංක 01 සඳහා වැරදිකරු බවත්, චෝදනා අංක 02 සිට චෝදනා අංක 05 දක්වා වූ චෝදනා, ඉඳුරාම හෝ වක්‍රව චෝදනා අංක 01 හා බද්ධ වන බැවින්, එකී චෝදනාවලට ද, චූදිත නිලධාරියා වැරදිකරු වන බවත්ය.

මෙම නිගමනය පරීක්ෂණ වාර්තාව අවසානයේ දක්වා ඇති විශේෂ සටහන් යටතේ දක්වා ඇති කරුණු හා එකිනෙක ගැටෙන බව බේරුම්කරු විශ්වාස කරයි.

පරීක්ෂණ වාර්තාව අවසානයේ දක්වා ඇති විශේෂ සටහන් යටතේ දක්වා ඇති කරුණු මෙසේය.

> "2019.02.14 දින 07.45 පැයට පමණ හෝ ඊට ආසන්න වේලාවකදී, යාන්ත්‍රික වැඩ කොට්ඨාසයේ වාස්තු වැඩ අංශයේ විවේකාගාරය තුළදී ඒ. බී. එච්. ෆාරුක් (කාර්යාල කාර්ය සහායක) හා එම්. එස්. එම්. හුසේනි (ගබඩා භාරකරු) යන අය බහින් බස්වීමක්, සිදුවීම යන කරුණු මුල්කොටගෙන සිදුකරන ලද මූලික විමර්ශනය හා පසුව සිදුකරන ලද කාර්යයන් තුළදී ඒ. බී. එච්. ෆාරුක් යන අය මෙම සිදුවීමට එනම්, විනය විරෝධී ලෙස කටයුතු සිදු නොකරන ලද බවට පූර්ව නිගමනයක් පදනම් කර ගනිමින් මෙහි මූලික කාර්ය සිදුවී ඇත. නොඑසේ නම්, බහින් බස්වීමක් තුළදී ඊට අදාළ වන්නාවූ සියලු පාර්ශ්වයන් සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ලබාදීම සිදුකළ යුතුවේ. එලෙස නොවන අවස්ථාවලදී චෝදනා පත්‍ර ලබා නොදීමට තරම් කරුණු (වී නම් ඒවා) පැහැදිලිව විනය ගොනුව තුළ අන්තර්ගත විය යුතුය. එබැවින් චූදිත එම්. එස්. එම්. හුසේනි යන අයට දඬුවම් පැමිණවීමේදී එම කරුණු සැළකිල්ලට ගැනීම වඩා සුදුසු බව කාරුණිකව පෙන්වා දෙමි."

ඒ අනුව චූදිත නිලධාරියා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ නිලධාරියා ලබාදී ඇති තීරණය යුක්ති සහගත සාධාරණ එකක් ද යන්න පිළිබඳ සැකයක් මතුවේ.

2.6 **විනය බලධරයාගේ විනය නියෝගය යුක්ති සහගත සාධාරණ එකක් ද යන වග**

විනය බලධරයා විසින්, චූදිත නිලධාරියා වෙත නිකුත් කර ඇති විනය නියෝගයේ දැක්වෙන්නේ බරපතල දඬුවමක් වශයෙන් ගැනෙන දින පහක වැටුප් දඩයක් පනවන බවය. එම දඬුවම ලබා දීමේදී විනය පරීක්ෂණ වාර්තාවේ විශේෂ සටහන් වශයෙන් සඳහන් කොටසේ චූදිත නිලධාරියාට දඬුවම් පැමිණවීමේදී සැළකිල්ලට ගත යුතුව තිබූ කරුණු සැළකිල්ලට නොගෙන චූදිත නිලධාරියාට බරපතල දඬුවමක් සේ සැලකෙන දින පහක වැටුප් දඩයක් දඬුවම් වශයෙන් පැනවීමට විනය බලධරයා ගෙන ඇති තීරණය ගැටළු සහගත අත්තනෝමතික එකක් බව බේරුම්කරු විශ්වාස කරයි.

පරීක්ෂණ වාර්තාවේ සඳහන් ඉහත සඳහන් ඌණතා හා සාක්ෂි පිළිබඳව කිසි ඇගයීමක් නොකොට පරීක්ෂණය අවසානයේ හුසේනි මහතා චෝදනා පත්‍රයේ චෝදනා අංක 1 ට ද චෝදනා අංක 2 සිට 5 දක්වා ද චෝදනාවලට වැරදිකරු කිරීම ගැටලු සහගත වේ.

එමෙන්ම, බහින් බස්වීම විනය රීති මාලාවේ 'ඉ' උපලේඛනයේ (3) 'අ' රීතිය යටතේ බරපතල විෂමාචාරයක් ලෙස සඳහන් වන්නේ ද නැත.

ඒ අනුව හුසේනි මහතාට දඬුවම් ලබාදීම සඳහා උපස්ථම්භක වූ මූලික විමර්ශනය හා විධිමත් විනය පරීක්ෂණය ද යුක්ති සහගත සාධාරණ අයුරින් සිදුවී නැති බවත්, එහෙයින් පළමුවන පාර්ශ්වයට වූ හුසේනි මහතාට, දෙවන පාර්ශ්වකරු විසින් ලබා දී ඇති විනය නියෝගය බල රහිත බවක් පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඒ අනුව පළමුවන පාර්ශ්වකරු විසින් දැඩිව ප්‍රකාශ කර සිටින පරිදි. විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා වුවද, ඔහු චෝදනා පහටම වැරදිකරු කිරීම මත දින පහක වැටුප් දඩයක් නියම කිරීම, යුක්ති සහගත සාධාරණ අන්දමින් සිදුවී නොමැති බව බේරුම්කරු පිළිගනී.

3.0 **දඬුවමක් ලෙස දින 5 ක වැටුප් අඩු කරමින් ලබාදී ඇති දඬුවම මගින් හුසේනි මහතාට අසාධාරණයක් සිදුවී ඇති බව**

දෙවන පාර්ශ්වය විසින් ඒ පිළිබඳව 2023.06.19 දිනැති සැළකිරීම්වල නෛතික තත්ත්වය යටතේ ඉදිරිපත් කර ඇති නඩු තීන්දු කිසිවක් ප්‍රශ්නගත සිද්ධිය කෙරෙහි අදාළ නොවන බව පෙන්වා දෙන අතර, පළමුවන පාර්ශ්වකරු සම්බන්ධයෙන් පනවා ඇති දඬුවම ලබා දීමෙන් දෙවන පාර්ශ්වයේ අයිතිවාසිකම් කඩවීමක් නොවන බව ද පෙන්වා දෙමි.

එහෙයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරනු ලබන එච්. එස්. එම්. හුසේනි මහතාට විරුද්ධව කරන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව දඬුවමක් ලෙස දින පහක වැටුප් අඩු කරමින් ලබා දී ඇති දඬුවම මගින් හුසේනි මහතාට අසාධාරණයක් සිදුවී ඇති බව බේරුම්කරු පිළිගනී.

4.0 **අසාධාරණයක් සිදු වී ඇති බැවින් පළමුවන පාර්ශ්වයට හිමිවිය යුතු සහන:**

ප්‍රශ්නගත සිදුවීම දැනට වසර 4 කට වැඩි කාලයට පෙර සිදුවී ඇති බැවින්, සාවද්‍ය සහගතව සිදුකර ඇති විධිමත් විනය පරීක්ෂණය වෙනුවට යළි විධිමත් විනය පරීක්ෂණයක් කිරීමට බේරුම්කරු තීරණය නොකරයි. ඒ වෙනුවට,

(1) පළමුවන පාර්ශ්වකරුට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝග අවලංගු කිරීමටත්,
(2) ඔහුට පනවා ඇති දඬුවම ඉවත් කිරීමටත්,
(3) එම දඬුවම දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින්නේ නම්, මේ දක්වා ඔහුගෙන් අයකර ගෙන ඇති වැටුප් වර්ධක අනුව ඔහුට සිදු වී ඇති පාඩුව ගණනය කර ආපසු ගෙවීමටත්,
(4) එකී වැටුප් දඩය නිසා සතුටුදායක සේවා කාලයක් නොමැතිවීම හේතුවෙන් ප්‍රමාද කරන ලද උසස්වීම, ඒ සඳහා සුදුසුකම් සපුරාලූ දිනය දක්වා පෙර දාතම් කිරීමටත්,

(5) එදින සිට එකී තනතුරට ලැබිය යුතු වැටුප් ගණනය කර හිඟ වැටුප් ලෙස රු.15842.31 ක මුදලක් ගෙවීමටත් දෙවන පාර්ශ්වයට නියම කරමි.

(6) හිඟ වැටුප, මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු මසක් ඇතුළත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බව දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

ආචාර්ය **ඒ. එච්. ගමගේ,**
බේරුම්කරු.

2024 මාර්තු මස 20 වන දින දී ය.

EOG 05 – 0200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.